


# අන්තර්ජාලයේ පුස්තකාලයකට පිවිසෙමු

"පුස්තකාලයක් යනු සිසිල් ගබඩා ගත කළ සිතිවිලි සමුදායකි" එසේ කිවේ සැමුවෙල් ශ්‍රීමතානන්ය. පොත්වල ප්‍රයෝජන පිළිබඳ ෆ්‍රැන්සිස් බේකන්ගේ අදහසද ඉතා රසවත්ය: "සමහර පොත් රස බැලිය යුතුය. තවත් සමහර පොත් ගිල දැමිය යුතුය. පොත් අතරින් කිහිපයක් හොඳින් විකා ජීර්ණය කර ගත යුතුය." ඔහු පොත් ගුල්ලෙක් වන්නට ඇති බව ඔබට නොසිතේද?

අපි අද අන්තර්ජාලයෙන් නොමිලේ පොත් කියවන්නට ඉඩ සළසන පුස්තකාල කිහිපයකට පිවිසෙමු.

**අන්තර්ජාලය දැනුම ලබාගන්න අපට ඉඩ ලබාදෙන සජීවී විශ්වකෝෂයකි.**

**අපි අද අන්තර්ජාලයෙන් නොමිලේ පොත් කියවන්නට ඉඩ සළසන පුස්තකාල කිහිපයකට පිවිසෙමු.**

## ● ගුටන්බර්ග් - Project Guttenberg [ http://www.promo.net/pg ]

මෙය සත්‍යයෙන්ම ඉතා වටිනා වෙබ් අඩවියකි. ඔබ පොත් ගුල්ලෙක් නම් ඔබේ සිත් පිනා යන පොත් කෝටි ගණනක් ගුටන් බර්ග් ව්‍යාපෘති වෙබ් අඩවියෙන් නොමිලේ කියවන්නට ඔබට හැකි වේ.

වසරකට පෙර ගුටන්බර්ග් ව්‍යාපෘතියේ අරමුණ වූයේ අන්තර්ජාලයෙන් නොමිලේ කියවීමට ට්‍රිලියනයක් (1,000,000,000,000) ලබා දීමටය. මේ සියලු පොත් සැකසෙන්නේ ස්වේච්ඡා සේවකයින් අතිනි. ඔවුන් පොත් ට්‍රිලියන කඩුල්ල පසුකළාදැයි මම නොදනිමි. එසේ නොවුවත් මට කම් නැත. මේ වසරේ පමණක් මම මේ වෙබ් අඩවියෙන් පොත් 150ක් පමණ කියැවුවෙමි. මා වසර 100ක් ඉක්මවා ජීවත් වුවත් මා හට ඇතිවන තෙක් කියවන්නට පොත් එහි තිබේ.

මෙහි පිවිස පොත් තෝරා ගන්නට පෙර ඔබට නුදුරු වෙබ් අඩවියක් තෝරා ගන්නට උපදෙස් ඔබට ලැබේවි. එම ලැයිස්තුවේ ඉහළින්ම ඇති ඇමරිකානු අඩවියක් තෝරාගන්න.

මෙහි ඇත්තේ කුමන ආකාරයේ පොත්ද? ඔබ විමසනු නිසැකය. හැම ආකාරයේම පොත් එහි තිබේ. සියල්ලන්හි විශේෂත්වය ඒවා පළමු මුද්‍රණයෙන් වසර 50ක් වන මුද්‍රණ හිමිකම් කාලය ඉක්මවූ ඒවා වීමය. එබැවින් මෑතකදී මුද්‍රිත පොත් එහි නොමැත. එහෙත් බයිබලය වැනි ආගමික පොත්ද රාජ්‍ය තන්ත්‍රය පිළිබඳ පොත්ද ලෝ පතල ලේඛකයින්ගේ ගද්‍ය පද්‍ය කෘතීන්ද ළමා පොත්ද එහි තිබේ. පොත් වැඩි හරියක් ඉංග්‍රීසි ඒවාය. වෙනත් යුරෝපීය භාෂා කිහිපයක පොත්ද එහි ඇත. උදාහරණ ලෙස මා කියවූ පොත් කිහිපයක් සඳහන් කරමි.

- පාහියන් හිමිගේ සංචාර
- බට්‍රන්ඩ් රසල් දාර්ශනිකයාගේ "මනස"
- හෙලන් කෙලර්ගේ ජීවිත කතාව
- බර්නාඩ් ෂෝගේ නාට්‍ය
- මාක් ට්වේන්, ආර්.එල්. ස්ටීවන්සන්, ඇන්ටන් චෙකෝව්, තෝමස් හාඩි, ඇල්ෆ්‍රඩ් හිච්කොක්, විල්කි කොලින්ස්, වැනි විවිධ යුග, ශෛලීන් හා සංස්කෘතීන්ට අයත් කතුවරුන්ගේ කෘතීන් සහ වෙනත් පොත් රැසක්ද කියවූවෙමි.

රඩියඩ් කිප්ලිංගේ ජන්ගල් බුක් සහ ඇලිස්ගේ විස්මලන්තය වැනි ළමා පොත්ද තාගෝර්ගේ සහ සරෝජිනි නායිදුගේ කවිද ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයන්ගේ කෘතිද නවකතා, කෙටිකතා සංග්‍රහද විද්‍යාත්මක කෘතීන්ද මේ අඩවියේ බහුලය.

අන්තර්ජාලය ඇසුරින් සකස් කළේ:
නිලූකා දිසානායක

© නිලූකා දිසානායක 2002-2003 - දිවයින පුවත් පතෙහි පළ වූ ලිපියකි

ශ්‍රී ලංකාවේ ප්‍රථම ඊමේල් සඟරාව වන ඊසයින් අත්වැලට

[ezine athwela]

අදම නොමිලේ දායකවන්න.

සුභවාදී චින්තනය, නිර්මාණශීලි බව සහ තවත් වෙබ් අඩවි එකතුවක් නිතිපතා ඊමේල් මගින් ලබාගන්න.

ezineathwela@sltnet.lk

මා මේ සියල්ල කියවූයේ අන්තර්ජාලයේ සිට නොවේ. ගුටන්බර්ග් ව්‍යාපෘතියේ අගය එයයි. එහි ඇති පොත් ඉතා සරල “ප්ලේන් වැනිලා” ඉලෙක්ට්‍රොනික ලේඛන සේ සැකසී ඇත. ඒවා මෙලෙසින් ඉදිරිපත් වන්නේ ලොව කොහේ කවුරුන් විසින් කෙතරම් කල්යල් පසින ලද කම්පියුටරයක් භාවිතා කළත් ඒ ඕනෑම කෙනෙකුට ඒවා කියවීමට හැකි වන ලෙසිනි. එලෙසම දෘෂ්‍යාබාධිත හා වෙනත් ශාරීරික ආබාධ ඇත්තවුනට විශේෂිත මෘදුකාංග භාවිතයෙන් කියැවීමටද මේ සරල ඉදිරිපත් කිරීම වැදගත්ය.

ඒවා ඔබේ කම්පියුටරයට ගෙන එහි සුරක්ෂිත කරගන්නට ඔබට ගතවන්නේ තත්පර ගණනකි. මෙහිදී ඔබට දෙවර්ගයක පොත් ලබාගත හැකිය. ඔබ සරල ලේඛණ (text file) ලෙස ලබාගන්නා පොත් එලෙසින්ම කියවීමට හැකිවේ. නමුත් ඒවා ප්‍රමාණයෙන් තරමක් විශාල බැවින් සිප්(Zip) ආකාරයෙන්ද පොත් ඔබේ කම්පියුටරයට ලබා ගැන්මට ගුටන්බර්ග් ව්‍යාපෘතිය ඉඩ සළසයි. ඉක්මනින් ලබා ගත හැකි සිප් ෆයිල් ගොනු කියැවීමට නම් ඔබට වින්සිප් (winzip) වැනි සරල මෙවලමක් අවශ්‍ය වේවි. එය “ඩවුන්ලෝඩ්” වෙබ් අඩවියෙන් නොමිලේ ලබාගන්නට අවශ්‍ය ලිපිනය වන්නේ: download.cnet.com/downloads යන්නය.

ඔබේ පොත් කම්පියුටරයේද දෘඪ තැටියේ (Hard Drive) තැන්පත් කරගෙන නිවාඩු පාඩුවේ කියවන්න. ඒවා මුද්‍රණය කරන්නට හිතන්න එපා. පිටු සිය දහස් ගණනක් මුද්‍රණයට වඩා අලුත්ම පොත මිලට ගැනීම වාසි සහගත වේවි.

ඔබ ගුටන්බර්ග් වෙතින් ගන්නා පොත් නැවත වෙනත් අයට බෙදා හැරීමට පෙර එහි සඳහන් කොන්දේසි කියවා බලන්න.

## ● බිබ්ලියෝමේනියා - Bibliomania.com

[ http://www.bibliomania.com]

ගුටන්බර්ග් ව්‍යාපෘතියේ ඇත්තේ “ප්ලේන් වැනිලා” රසය නම් බිබ්ලියෝමේනියාහි විවිධාකාර රසවත් ඉදිරිපත් කිරීම් ඇත. මෙහි ඇති ලේඛන ගණන සීමිත වුවත් එහි කලාත්මක ඉදිරිපත් කිරීම කෘතියේ රසවින්දනය ඔප් නංවයි.

නමුත් එම රසවින්දනයට ඔබ අතිරේක වියදමක් දැරිය යුතුය. පිටුවෙන් පිටුව හෝ පරිච්ඡේදයෙන් පරිච්ඡේදය අන්තර්ජාලයේ සිටම කියැවීමට ඔබට සිදු වෙයි. මා හට එම නිදහස නැත. ඒ මා සතු කාලය සහ මුදල් යන දෙකම සීමිත බැවිනි.

නමුත් අධ්‍යාපනික සහ පර්යේෂණ කටයුතුවලට මේ අඩවිය බොහෝ උපකාරී වේ. පොත්වලට අමතරව ලේඛකයින් පිළිබඳ තොරතුරුද ඒ ඒ කෘතීන් අධ්‍යයනයට අදාල සටහන්, විමර්ශන සහ විවේචනාත්මක ලිපිද එහි ඇතුළත්ය. පාඩම් ආධාරක සහ ගුරුවරුනට සටහන්ද බිබ්ලියෝමේනියා වෙතින් ලබාගත හැකිය.

කවි, කෙටිකතා, නාට්‍ය කෘතීන්ද නවකතා සහ කෙටිකතාවලට අමතරව සාකච්ඡා සහ විවිධ මාධ්‍යවල පළවූ ලිපි රැසක්ද එහි ඇතුළත්ය. මීට අමතරව ජීවිත කතා, ආගමික පොත්පත්. පර්යේෂණ කෘතීන්, ශබ්දකෝෂ සහ වෙනත් කෘති එහි ඇත.

- **අන්තර්ජාලයේ ළමා සාහිත්‍යය**
  Children's Literature Web Guide

[ http://www.acs.ucalgary.ca/~dkbrown/ ]

කැනඩාවේ කැල්ගරි විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් සම්පත් පුස්තකාලය මඟින් පවත්වාගෙන යන අන්තර්ජාල ළමා සාහිත්‍ය අඩෙවිය ලොකු කුඩා ළමුන්ටත් නව යෞවනයන්ටත් ඉතා අගනා අඩෙවියකි.

ඔබ වෙනුවෙන් මේ පුස්තකාලය සිසාරන විට මාහට හැන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන්ගේ අවලස්සන තාරා පැටියා සහ බැන්ෆ් නම් කුහුඹි වීරයා හමු විය. තාරා පැටවා ගැන ඔබ දන්නවා ඇත. බැන්ෆ්ද සැබෑ වීරයෙකි. ඔහුගේ වීර වික්‍රමයන් මෙන්ම ළමා තරුණ දෙපරපුර වෙනුවෙන් ලියැවුණ කෘතීන් රැසක් ඉතා විචිත්‍ර ලෙස රූප සහිතව කියවන්නට මේ පුස්තකාලය ඉඩ සළසයි.

දරුවන් වෙනුවෙන් නිකුත් වන අලුත් පොත්පත් ගැන විස්තරද පාඩම් ආධාරකද දෙමාපියන්, දරුවන් සහ ගුරුවරුන් සඳහා අවැසි සම්පත්ද මේ වෙබ් අඩෙවියේ ඇත. එසේම මේ සැමට ප්‍රයෝජනවත් වෙනත් වෙබ් අඩෙවිවල තොරතුරු සහ ඒවාට සෘජුව පිවිසීමට සබඳතාද (links) මෙහි ඇත.

පොත් කියවන්නට අකමැති පුංචි කාටත් පොත්වල රසය උගන්වන්නට මේ වෙබ් අඩෙවිය ප්‍රයෝජනවත් වේවි. පුංචි අයට වගේම ලොකු අයටත් එකතු වී අන්තර්ජාලයෙන් පොත් බලන්නට මෙය කදිම අවස්ථාවක් කරගන්න.

- **වර්ල්ඩ් වයිඩ් වෙබ් වර්චුවල් ලයිබ්‍රරිය**
  WorldWideWeb Virtual Library

[ http//vlib.org]

මෙයද සිසුන් සහ ඉගැනුමට ලැදි සැම දෙනා විසින් පිවිසිය යුතු අන්තර්ජාලයේ නොමිලේ පොත් සපයන පුස්තකාලයකි.

- **බුක්ස්-ඔන්-ලයින් - books-on-line.com**

[http://www.books-on-line.com]

මෙම අඩෙවියේද නොමිලේ ලබා ගත හැකි පොත් සමහරක් තිබේ.

- **අයි පික්චර් බුක්ස් - ipicturebooks.com**

[http://www.ipicturebooks.com]

මෙහිද නොමිලේ පොත් ලබා ගත හැකිය.

කොහෙන් කුමන පොත් ලබාගත්තත් ඒවා කියවා අවසානයේ ඔබේ දෘඩ තැටියෙන් ඉවත් කරන්නට අමතක කරන්න එපා.

ඔබට නැවත කියවීමට අවශ්‍ය පොත් හෝ පිටු තිබේනම් ඒවා ඔබේ බ්‍රවුසරයේ ෆේවරිට්ස් (Favourites) විකල්පය යටතට ගොස් Add to Favourites මඟින් නිතර බලන්නට හැකි ලෙස සළකුණු කරගන්න.❑

ඔබට යම් විශේෂ තේමාවක් සඳහා අදාල වෙබ් අඩෙවි පිළිබඳ තොරතුරු අවශ්‍යද?

ඒ ගැන අපට දන්වන්න.

අනාගතයේදී අපි ඒ ගැන තොරතුරු ඔබ වෙත ගෙන එන්නට උත්සාහ කරනවා.

ඔබට ezineathwela@sltnet.lk මඟින් අප හා සම්බන්ධ විය හැකියි.

ඒ සඳහා පහත සඳහන් විස්තර අප වෙත එවන්න.

නම:

වයස:.

ලිපිනය:

දුරකථන:

ඊමේල්:

මම

- ☐ පාසැල් ශිෂ්‍යයෙක්මි
- ☐ රැකියාවක නියුතු වෙමි
- ☐ ව්‍යාපාරිකයෙක්මි
- ☐ වෙනත් (සඳහන් කරන්න)